**වන සත්ත්ව සංරක්ෂණ අරමුදල - 2020**

---------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව ඉකුත් වර්ෂවලදී කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණු රු.67,212,382 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීම, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. තවද සමාලෝචිත | සමාලෝචිත වර්ෂයට අදාළ ඉදිකරමින් පවතින ගොඩනැගිලි සඳහා මුදලින් දරන ලද වියදම රු.210,869,157 ක් බවත් ප්‍රමාද දෝෂයකින් ඉන් | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් ගලා යාම් නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ ඉදිකරමින් පවතින ගොඩනැගිලි සඳහා දරන ලද වියදම රු.210,869,157 ක් වුවද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ගලා යාම් රු.143,656,774 ක් වශයෙන් රු.67,212,383 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රු.67,212,382 ක් නිමි ගොඩනැගිලි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පමණක් සටහන් වී ඇති බව දන්වමි. | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 13 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් සතුව පවතින වත්කම් ඒවායෙහි සමාන ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වයේ සමාන බව පදනම් කරගෙන මූල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීමේ පරමාර්ථයෙන් කාණ්ඩගත කර දැක්විය යුතු වුවද, වඳුරු මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා 2019 වර්ෂයේ මිලදී ගත් රු.24,140,000 ක් වටිනා එන්ඩස්කොපි යන්ත්‍ර දෙකක් කාර්යාල උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 22 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීම වෙනුවෙන් දරන වියදම් හේතුවෙන් වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලා ඒමේ භව්‍යතාවයක් තිබේ නම් දේපල පිරියත හා උපකරණවල අගය වැඩි වීමක් ලෙස හඳුනා ගෙන ප්‍රාග්ධනිත කළ යුතු වුවද, ලුණුගම් වෙහෙර ජාතික උද්‍යානයේ කළු පාලම ප්‍රතිස්ථාපනය සඳහා දරන ලද රු.11,547,986 ක් ප්‍රාග්ධන ගත නොකර පුනරාවර්තන වියදම් ලෙස ලියාහැර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නඩු 23 කට අදාල උසාවි දඩ මුදල් රු.1,700,000 කින් අඩුවෙන් හා නඩු 2 කට අදාල උසාවි දඩ මුදල් රු.65,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතන ව්‍යුහය වැඩි දියුණු කිරීම් වත්කම් සඳහා, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේදී රු.547,171 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ක්ෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත හා සේවා පනතේ 37 සහ 43 වගන්ති | උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානයේ කොළ අතුවල බර කිරීම සඳහා භාවිතා කරන අත් දුණු තරාදිය සහ ඇත් අතුරු සෙවනෙහි එළවළු සහ පළතුරුවල බර මැනීම සඳහා භාවිතා කරන ඉලෙක්ට්‍රොනික් තරාදිය පනත ප්‍රකාරව පරීක්ෂාවකින් හෝ මුද්‍රා තැබීමකින් තොරව භාවිතා කර තිබුණි. | අලි රැඳවුම් මධ්‍යස්ථානයේ ඇති දුනු තරාදිය මිලදී ගනු ලැබුවේ එක් එක් සතා වෙනුවෙන් එක් එක් ආහාර වේල සඳහා දිය යුතු ප්‍රමාණය ගණනය කිරීමට වැනි අභ්‍යන්තර කටයුතු සඳහා වන අතර මෙහි ඇති පාලම් තරාදිය විදුලි සැර වැදී අක්‍රිය වීමෙන් පසු රැගෙන ආ කොළ අතුවල බර කිරීමට එම දුනු තරාදිය භාවිතා කළ බව දන්වමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 132(2), (4),(5) වගන්ති | සැපයීම් සම්බන්ධයෙන් වියදම් අනුමත කිරීමේදී අදාළ සැපයුම නියමිත ප්‍රමාණයෙන් පවතින බවටත් ඒවා පරීක්ෂා කොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බවටත් අනුමත කරන නිලධාරියා තහවුරු කර ගත යුතු වුවත්, ඊට පටහැනිව උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානයට කොළ අතු මිලදී ගැනීම සඳහා අවිධිමත් ක්‍රමවේදය අනුව සැකසූ අනුමාන බර වාර්තා මත පදනම්ව රු 8,896,827.ක් ගෙවා තිබුණි. | උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානයේ පාලම් තරාදිය ආරම්භයේ සිට විදුලිසැර වැදී අක්‍රිය වන තෙක් සතොක්ෂණය කර ඇත. එය අළුත්වැඩියා කරන තෙක් අවශ්‍යතාවයන් සඳහා එම මධ්‍යස්ථානයේ ඇති දුනු තරාදිය භාවිතා කළ අතර, දැනට පාලම් තරාදියේ අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය | වටිනාකම රු 500,000. ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත් රු 1,366,000.ක් වූ පිහිණුම් හා කිමිදුම් උපකරණ මිලදී ගන්නා ලද සමාගම සමඟ ලිඛිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණි . | මෙහිදී SABCCO සමාගම සමඟ ගිවිසුම් ගතවීමක් සිදු නොවුනද අදාළ භාණ්ඩවල වටිනාකමින් සියයට 10 වන රු.136,600 ක මුදලක් ඇප මුදල් වශයෙන් තැන්පත් කර ගැනීම සිදුකර ඇති බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ජුනි 13 දිනැති හා අංක 01/2018 (**i**) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | සියලුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නාවූ විවිධ සේවාවන් සඳහා දැනට අය කරනු ලබන ගාස්තු සියයට 15 කින් ඉහළ දැමිය යුතුය. එසේ වුවද 2006 පෙබරවාරි 20 දිනැති අංක 1433/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික රක්ෂිතයක හෝ අභයභූමියක පිහිටි ජලාශයක මසුන් ඇල්ලීමට භාවිත කරනු ලබන ධීවර යාත්‍රා සඳහා අය කරනු ලබන රු.250 ක බලපත්‍ර ගාස්තුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි . | ගැසට් පත්‍රය සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගතයුතු බැවින් ඒ සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2002 පෙබරවාරි 11 දිනැති අංක 16/2002 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 1.1 හා 1.2 ඡේද | ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර ආදායමින් අය කරනු ලබන සේවා ගාස්තු කාර්ය මණ්ඩලය අතර බෙදාහැරීමේදී වැටුප් රහිත නිවාඩු දින 01 සිට දින 10 දක්වා ලබා ගත් අයගෙන් සියයට 10 ක් හා දින 11 ට වඩා වැටුප් රහිත නිවාඩු | 2020 වර්ෂයේ සේවාගාස්තු උපදේශන කමිටුව හරහා වනසත්ව සංරක්ෂණ අරමුදලට බැරකිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

ලබා ගත් අයගෙන් සියයට 50 ක් වශයෙන් අඩුකර ගනු ලබන සේවා ගාස්තුව වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට නැවත බැර කළ යුතු වුවද, නිලධාරීන් 14 දෙනෙකුගෙන් අඩුකර ගන්නා ලද රු.1,829,200 ක මුදල බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.282,296,192 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,282,370,046 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,564,662,238 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අරමුදලේ ආදායම් වූ උද්‍යාන පිවිසුම් ගාස්තු රු.1,422,924,461 කින්, සේවා ගාස්තු රු.231,970,231 කින් හා උද්‍යානවලට වාහන ඇතුළත් කිරීමේ ගාස්තු රු.51,449,395 කින් පහළ යාමත්, යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ, ගොඩනැගිලි නඩත්තු වියදම් රු.29,120,712 කින් හා විදුලි වැට නඩත්තුව හා නඩත්තු සේවක කුටි සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ වියදම රු.48,684,848 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් 28 ක් සඳහා රු.367,357,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 18 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂය පුරා රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොතිබුණු බව දන්වමි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක ගත කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ සැලසුම් කල ගිලුණු නැව් පිළිබඳව සිදු කරනු ලබන ජෛව විවිධත්ව සමීක්ෂණය (2019) (biodiversity survey and declaration of ship wrecks) ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට රු.2,956,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ව්‍යාපෘතිය සැලසුම් කල පිහිණුම් උපකරණ සියල්ල 2019 මාර්තු 31 දින වන විට මිලදී ගෙන තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිලුනු නැව් පිළිබඳව සිදු කරනු ලබන ජෛව විවිධත්ව සමීක්ෂණය 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සම්පත් දායකවරුන් සපයා ගැනීමේ පැවැති දුෂ්කරතා හේතුවෙන් නොහැකි වූ අතර 2020 වර්ෂයේ දී covid 19 වසංගත තත්වය හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය සිදු කිරීමට නොහැකි වූ බව දන්වමි. | ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |